# කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

## BCOME 1035 - මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

මධු එන්ටර්ප්‍රයිස් ශාඛාවක් හා ප්‍රධාන කාර්යාලයක් පවත්වාගෙන යයි. 2015 මාර්තු 31 දින පහත ශේෂ පිරික්සුම පොත් වලින් උපුටා ගන්නා ලදී.

| | ප්‍රධාන කාර්යාලය | | ශාඛාව | |
|---|---|---|---|---|
| | හර (රු.) | බැර (රු.) | හර (රු.) | බැර (රු.) |
| ප්‍රාග්ධන ගිණුම | - | 471,000 | - | - |
| ගැනිලි | 84,000 | - | - | - |
| පිරියත පිරිවැයට | 240,000 | - | 120,000 | - |
| පිරියත මත සමුච්චිත ක්ෂය | - | 120,000 | - | 60,000 |
| ශාඛාවට යැවූ භාණ්ඩ / ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ | - | 792,000 | 720,000 | - |
| ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම | - | - | - | 156,000 |
| ශාඛා ජංගම ගිණුම | 258,000 | - | - | - |
| උපලබ්ධි නොවූ ලාභ වෙන්කිරීම් (2014.04.01) | - | 6,000 | - | - |
| මෙහෙයුම් වියදම් | 30,000 | - | 15,000 | - |
| ගැණුම් | 2292,000 | - | - | - |
| කුලී හා වරිපනම් | 45,000 | - | 18,000 | - |
| විකුණුම් | - | 2100,000 | - | 900,000 |
| 2014.04.01 ට තොග | 180,000 | - | 36,000 | - |
| ණයගැතියෝ | 90,000 | - | 75,000 | - |
| ණයහිමියෝ | - | 135,000 | - | - |
| වැටුප් හා වේතන | 360,000 | - | 120,000 | - |
| මුදල් හා බැංකු | 45,000 | - | 12,000 | - |
| | **3624,000** | **3624,000** | **1116,000** | **1116,000** |

අනෙකුත් තොරතුරු ඃ

අ. සියළුම භාණ්ඩ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගනු ලබයි. ශාඛාවට ලබා දිය යුතු භාණ්ඩ ප්‍රධාන කාර්යාලය පිරිවැයට 20 % ක් එකතු කර ප්‍රධාන කාර්යාලය ලබාදේ. 2015 මාර්තු 31 දින ප්‍රධාන කාර්යාලය සතුව පිරිවැය රු. 240,000 ක් වූ භාණ්ඩ පැවතුණි. එම දිනයේම, ශාඛාව තුළ එයට රු. 54,000 කට ඉන්වොයිසි කළ භාණ්ඩ පැවතුණි.

ආ. ස්ථාවර වත්කම් හීනවන ශේෂ ක්‍රමය යටතේ 20 % ක වාර්ෂික අනුපාතයකට ක්ෂය කළ යුතු වේ. වර්ෂය තුළ ස්ථාවර වත්කම් වල කිසිදු මිලදී ගැනීමක් හෝ විකිණීමක් සිදු වී නොමැත.

ඇ. ප්‍රධාන කාර්යාලය ශාඛාවට රු. 72,000 කට ඉන්වොයිසි කළ භාණ්ඩ 2015 මාර්තු 31 වන විටත් මාර්ගස්ථව පැවතුණි.

ඈ. 2015 මාර්තු 31 දින රු. 30,000 ක මුදල් ශාඛාවෙන් ප්‍රධාන කාර්යාලයට මාර්ගස්ථව පැවතුණි.

ඉ. 2015 මාර්තු 31 දිනට පහත වියදම් උපචිත විය.

ප්‍රධාන කාර්යාල වැටුප් රු. 2000, කුලී රු. 1000

ශාඛාව ඃ වැටුප් රු. 1000, කුලී රු. 2000

ඔබ විසින් තීරු ක්‍රමය යටතේ,

i. ප්‍රධාන කාර්යාලයට

ii. ශාඛාවට

iii. සමස්ථ ව්‍යාපාරයට

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය සහ 2015 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 30)

02. ආයතනයක අරවින්ද සහ ශාන්ත සමාන හවුල්කරුවෝ වෙති. මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත පරිදි වන අවස්ථාවේදී 2015 දෙසැම්බර් 31 ඔවුන් තම හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී.

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

| හිමිකම සහ වගකීම් | | අගය (රු.) | වත්කම් | අගය (රු.) |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | - අරවින්ද 300,000<br>ශාන්ත 300,000 | 600,000 | බදු ඉඩම | 300,000 |
| සංචිත | | 50,000 | පිරියත | 235,000 |
| ණය | | 200,000 | ලීබඩු | 125,000 |
| විවිධ ණයහිමියෝ | | 135,000 | තොග | 210,000 |
| | | | විවිධ ණයගැතියෝ | 60,000 |
| | | | මුදල් හා බැංකු | 55,000 |
| | | **985,000** | | **985,000** |

වත්කම් පහත පරිදි උපලබ්ධි විය.

| | රු. |
|---|---|
| බදු ඉඩම | 360,000 |
| ලී බඩු | 112,500 |
| තොග | 202,500 |
| පිරියත | 240,000 |
| විවිධ ණයගැතියෝ | 52,500 |

ණයහිමියන් සම්පූර්ණයෙන්ම පියවීම සඳහා රු 127,500 ක් ගෙවන ලදී. උපලබ්ධි වියදම රු15,000 කි.

ආයතනයේ පොත් පියවීම සඳහා

උපලබ්ධි ගිණුම, බැංකු ගිණුම, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම පිළියෙල කරන්න.

(මුළු ලකුණු 25)

03. අ. මෙහෙයුම් කල්බදු සහ මූල්‍ය කල්බදු අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. මෙහෙයුම් කල්බදු කල්බදු හිමියාගේ ගිණුමේ ගිණුම් ගත කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. ආයතනයක් තවත් වත්කමක් ආයතනයකින් කල්බද්දට ගන්නා ලදී. වත්කමේ සාධාරණ අගය රු. 100,000 ක් වන අතර කල්බදු වාරිකය අර්ධ වාර්ෂිකව රු. 18,000 ක් ගෙවියයුතු වේ. පළමු ගෙවීම වත්කම භාරදීමත් සමඟ ගෙවන ලදී. වර්ෂ 3 ක කල්බදු කාලසීමාවෙන් පසු සහතික නොකරන ලද අවශේෂ අගය රු. 4,000 කි. කල්බද්දේ ව්‍යාංග පොලිය 9.3% (ආසන්නව) වන අතර අවම කල්බදු ගෙවීමෙන් වර්තමාන අගය රු. 96,936 කි.

අවශ්‍ය වන්නේ,

මෙම කල්බද්ද කල්බදු ගැනුම්කරුගේ ගිණුමෙහි ගිණුම් ගත කරනුයේ කෙසේද යන්න පෙන්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. මිරනල් කොන්ත්‍රාත්කරුවෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා වර්ෂ 3 ක් ගත වේයැයි අපේක්ෂා කෙරේ.

සමාගම මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 12,000,000 ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවකට අත්සන් කරන ලදී.

පළමු වර්ෂය සඳහා දැරූ වියදම් වල විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| වැඩ බිමෙහි ශ්‍රම පිරිවැය | රු. 1000,000 |
| කොන්ත්‍රාත් අමුද්‍රව්‍ය පිරිවැය | රු. 3000,000 |
| ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යොදා | |
| ගත් විශේෂ යන්ත්‍ර හා පිරියත වල ක්ෂය | රු. 500,000 |
| අලෙවිකරණ හා විකුණුම් පිරිවැය | රු. 1000,000 |
| මුළු අගය | රු. 5500,000 |
| සම්පූර්ණ කිරීම සඳහා මුළු කොන්ත්‍රාත් පිරිවැය | රු. 5500,000 |

අවශ්‍ය වන්නේ,

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 යටතේ සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය සහ හඳුනාගත යුතු අයභාර, පිරිවැය සහ ලාභ අගයන් ගණනය කරන්න.

(මුළු ලකුණු 15)

05. අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 යටතේ "තොග" යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 යටතේ හෙළිදරව් කිරීම් 5 ක් සටහන් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 15)